ක්‍රිකට් ක්‍රීඩාවේ ලෝක ඉතිහාසය

ලෝක ඉතිහාසය

1. ක්‍රිකට් ක්‍රීඩාවේ ආරම්භය ගැන විවිධ මත ඇත. ක්‍රිකට් ක්‍රීඩාවට සමාන ක්‍රීඩා විශේෂයක්. 12 වන සියවසේදි එංගලන්තයේ පැතිරෙමින් තිබු බවට සාක්ෂි ඇත. මේවා එකල ක්ලබ් බෝල් හා ස්ටූල් බෝල් යනුවෙන් හදුන්වා ඇත. මේ ක්‍රීඩාව ආභාෂයෙන් ක්‍රිකට් ක්‍රීඩාව බිහිවී ඇති බව සැලකේ. ක්‍රිකට් ක්‍රීඩාව එංගලන්තයේ මුලින්ම ප්‍රචලිත වූයේ කෙනෙට් හා සසෙක්ස් ප්‍රාන්ත එඩේරුන් අතරය. ක්‍රිකට් ක්‍රීඩාව 12 වන ශත වර්ෂයේ බිහි වුවත්, පිලිගත හැකි සාධකයක් ලෙස ඇත්තේ 14 වන ශත වර්ශයට අයත් චිත්‍රයකි මුලින්ම ක්‍රිකට් සමාජය බිහි වුයේ 18 වන ශත වර්ෂයේදි හැමිල්ටන් සමාජය නමින්ය.

2. ක්‍රිකට් ක්‍රීඩාවේ ඉතිහාසය මෙපමණකට සීමා නොවේ. නීති 42 කින් සමන්විත මෙම ක්‍රීඩාව කලින් කළ නිති සංශෝධනය වෙමින් තාක්‍ෂණයත් සමග විශාල දියුණුවක් ලබමින් අද ලෝකයේ ජනප්‍රියතම ක්‍රීඩා කිහිපය අතරට එක් වී තිබේ.

ලංකා ඉතිහාසය

3. ඉංග්‍රිසි ජාතිකයින් ශ්‍රී ලංකාවට පැමිණීමත් සමගම ක්‍රිකට් ක්‍රීඩාව ශ්‍රී ලංකාවට හදුන්වා දි ඇත. එසේ වුවත් දැනට ලැබී ඇති වාර්ථා අනුව පළමුවන ශ්‍රී ලංකා ක්‍රිකට් සමාජය වන කොළඹ ක්‍රිකට් සමාජය 1832 සැප්තැම්බර් 06 වන දින පිහිටුවා ඇත. එම වාර්තා අනුව ශ්‍රී ලංකාවේ පළමුවන ක්‍රිකට් තරගය 1832 නොවැම්බර් මස 03 වන දින කොළඹ ක්‍රිකට් සමාජය සහ බ්‍රිතාන්‍ය යුධ හමුදාවේ 97 වන රෙජිමේන්තුව අතර පවත්වා ඇත.

4. ශ්‍රී ලංකාවට පැමිණි පළවන විදේශ ක්‍රිකට් කණ්ඩායම ලෙස එංගලන්ත ක්‍රිකට් කණ්ඩායම හැදින්වේ. එංගලන්ත ක්‍රිකට් කණ්ඩායම ඕස්ටේලියාවට යන අතරතුරදි ශ්‍රී ලංකාවට ගොඩ බැස 1882 ඔක්තොම්බර් මස 13 වන දින ශ්‍රී ලංකා කණ්ඩායමත් සමග ක්‍රිකට් තරගයක් පවත්වා ඇත. මෙහිදි එංගලන්ත කණ්ඩායමේ නායකයා ලෙස සර් අයිවෝ බිලයි මහතා කටයුතු කර ඇති අතර, මෙය ක්‍රිකට් තරඟය ගාලු මෝදර පිටියේදි පවත්වා ඇති බව වාර්ථාගත වී ඇත. එංගලන්ත පිලට ක්‍රීඩකයින් 11 දෙනෙක්ද ශ්‍රී ලංකා පිලට ක්‍රීඩකයින් 19 දෙනෙක්ද සහිතව පවත්වා ඇති මෙම තරගය දින දෙකක් තුළ පැවති අතර, මෙය ජය පරාජයකින් තොරව අවසන් වී ඇත.

අ. ශ්‍රී ලංකා ක්‍රිකට් සම්මේලනය 1922 ජුලි මස 13 වන දින පිහිටුවා ඇත.

ආ. 1964 වර්ෂයේදි ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර ක්‍රිකට් සංවිධානයේ අර්ධ සමාජිකයෙකු වශයෙන් බඳවා ගන්නා ලදි.

ඇ. 1981 වර්ෂය වන විට ලංකාව ක්‍රිකට් ක්‍රීඩාව නිළ වශයෙන් නියැලි වර්ෂ 99 ක් ගත වී ඇත. නිළ නොවන ටෙස්ට් තරග 51 කට සහභාගි වී ඇත.

ඈ. ශ්‍රීලංකව පළමුවන ටෙස්ට් තරගය 1982 පෙබරවාරි 17 වන දින පවත්වා ඇති අතර, එම තරඟය කොළඹ පී සරවනමුත්තු ක්‍රීඩාංගනයේදි පවත්වා ඇති අතර, එම තරඟයෙන් එංගලන්ත කණ්ඩායම ජයග්‍රහණය කර ඇත.

ක්‍රිකට් ක්‍රීඩාවේ නීති

5. ක්‍රිකට් ක්‍රීඩාව නීති 42 කින් සමන්විත වේ. එනම් මෙහි පහත සඳහන් නිති ඊට අදාල වේ:

අ. ක්‍රීඩකයින්.

ආ. ආදේශකයා.

ඇ. විනිසුරු.

ඈ. ලකුණු සටහන් කරන්නා.

ඉ. බෝලය.

ඊ. පිත්ත .

උ. තනතිල්ල .

ඌ. කඩුල්ල

එ. තණනිල්ලේ ක්‍රීස් එක.

ඒ. නිල භූමිය සැකසීම.

ඔ. ඉනිමක් යනු කුමක්ද

ඕ. පිට පිට දෙවරක් පහර දිම.

ක. විවේක කාල

ඛ. තරග ආරම්භය අවසානය.

ග. තරග ආරම්භ කරන පිටිය තුල පුහුණුවීම.

ඝ. දිවීමකදි උපයන ලකුණු.

ච. ලකුණු සීමාවන් 4/6.

ජ. පන්දුව පිටිය තුල අස්ථාන ගත වීම

ජ. ප්‍රටීපල

ඤ. පන්දු යවන්නා.

ට. පන්දුව අජීවි කිරීම.

ඨ. නිපන්දුව.

ඩ. ඈත පන්දුව(wide ball).

ඪ. අමතර උපයන ලකුණු.

ණ. ඉල්ලීම.

ත. කඩුල කැඩියාම.

ථ. පිතිකරු සීමාව තුල නොසිටීම.

ද. පන්දුව විකෙට්ටුවේ වැදි දැවියාම.

ධ. කාල බාධක.

න. උඩ පන්දුව.

ඳ. ජීවිව පවතින පන්දුව ඇල්ලීම.

ප. ජීවි පන්දුවට දෙවරක් පහර දිම.

ඵ. තමා විසින්ම කඩුල්ල කඩා ගැනිම.

බ. කඩුල්ල මුවා කිරීමේ වරද.

හ. පන්දු රකින්නාට බදා කිරීම.

ම. දුවද්දි දැවී යාම.

ය. ස්ටම්ප් කිරීම.

ර. කඩුලු රකින්නා

ල. ක්‍රීඩකයා.

ව. සාධාරන අසාධාරන.

ශ. තිල්ල ආවරණය

ෂ. කෙළවර කිරීම (පාවා දීම)

<u>ක්‍රීඩකයින්</u>

6. ක්‍රීඩාක සංඛ්‍යාව 11 දෙනෙකි. 11 දෙනාගෙන් එක් අයෙකු කඩුල්ල රකින්නා ලෙස නම්කල හැක. එහෙත්, එක් කණ්ඩායමක ක්‍රීඩකයින් නම් කිරීම සීමාවක් නොමැති අතර, තරගයකදි නායකයා විසින් ක්‍රීඩාකරන ක්‍රීඩකයින් 11 දෙනා නම්කල යුතුය. ඉන්පසුව අනෙක් කණ්ඩායමේ නායකයා හා ප්‍රධාන විනිසුරුවන් දැනුවත් කිරීමකින් තොරව ක්‍රීඩකයින් මරු කිරීම කල නොහැක.

<u>ආදේශකයා</u>

7. ආදේශක දුවන්නෙකු ලබා ගැනිමට හැකි වනුයේ සාධාරණ හේතුවක් සඳහා පමණි. මෙහිදි ආබාධයකට ලක්වු පුද්ගලයා පරීක්‍ෂා කිරීම සධාරණ විය යුතු වේ. පන්දුව රකින්නා හට ආදේශකයෙක් ලැබෙනුයේ එහිදි ක්‍රීඩකයා අනතුරකට පත් උවහොත් හා නැතිනම් ඔහුට අත්‍යඅවශ්‍ය ක්‍රියාවක් සඳහා පමණි. තුවාල කරුවෙකු පිටියට රැගෙන ඒමට නොහැකි අතර, යම් ක්‍රීඩකයෙකු නම් කර සිටියදි අනතුරකට ලක් වුයේනම් හෝ ඒ සඳහා ආදේශකයෙකු ලබාගත හැක. හමුදා නිළධාරියෙක් වෛද්‍යවරයෙකු හට හදිස්සි කැඳවීමක් නිසා ආදේශකයෙක් යෝදවා යාමට විනිසුරු හට අවසර දිය හැක. ආදේශක ක්‍රීඩකයෙකු සඳහා කඩුලු රැකිමට ඉඩ නොලැබේ. එය නිතියෙන්ම තහනම් වේ. ආදේශකයා කුමණ තරාතිරමේ උවත් ඔහුට නායකත්වය දැරිය නොහැක.

<u>විනිසුරු</u>

8. ජාත්‍යන්තර තරග සඳහා ICC (INTERNATIONAL CRIKET COUNCIL) වෙතින් විනිසුරුවන් සිව් දෙනෙකු පත් කෙරේ. ජාතික මට්ටමේ තරග නම් විනිසුරුවන්ගේ සංගමයෙන් පත් කෙරේ. සැම විටම ටෙස් තරගයක් සඳහාම විනිසුරුන් දෙදෙනාම විදේශකයින් වන අතර, අනෙක් තරග සඳහා එක් විනිසුරුවෙකු විදේශකයෙක් විනිසුරුවෙකු වේ. විනිසුරුවන් දෙදෙනාම පිටිය සඳහා නම් කිරීමේදි පැති දෙක තොරා ගැනේ. යම් හෙයකින් එක් විනිසුරු වරයෙකු අසනිප වුවහොත් හෝ හදිසි අවස්ථාවක් වුව හෝත් තුන්වන විනිසුරු (TV UMPIR) ඇතුලට පැමිණ අනෙක් අතිරේක විනිසුරු ලෙස කටයුතු කරයි. විනිසුරුවන්ගේ රාජකාරි වනුයේ ක්‍රීඩකයින් පිටියට පැමිණිමට විනාඩි 30 කට පෙර විනිසුරුවන් දෙදෙනා ක්‍රීඩාකරන පිටිය තුලට පැමිණිය යුතුය. කඩුලු අතර දුර මැනිම. ක්‍රීඩා පිටියේ සියලුම මිනුම් පරීක්‍ෂා කිරීම. කඩුල්ලේ පළල උස පරීක්‍ෂාවට ලක් කිරීම. සාධාරණ ලෙසද අසාධාරණ ලෙසද ක්‍රීඩාව කරන බව පරීක්‍ෂා කිරීම. විනිසුරු ස්ථානගත විමේදි මැද ඉන්නට කෙලින් සිටින සේ අඩි 06 ක් පිටුපසින් සිටිය යුතු අතර, පැති විනිසුරු යාර 30 සිමාවට ඇතුලෙන් සිටිය යුතු වේ.

<u>ලකුණු සටහන් කරන්නා.</u>

9. ලකුණු සටහන් කරුවන් සත්කාරක රට විස්තර කල යුතු අතර, තරගයකදි කණ්ඩායම් දෙකම සඳහා දෙදෙනෙකු සිටිය යුතුය. මෙහිදි ආරාධිත කණ්ඩායමේ පොත නඩත්තු කිරීමේදි මෙම ලකුණු සටහන් කරුවන් දෙදෙනාගෙන් කෙනෙකු පත්විය යුතුය. විනිසුරුගේ සංඥා ලබාගත් බව ඇගවිය යුතුය. සැම විටම සැම පන්දුවාරයකම පන්දු ගණන විනිසුරුවන් විසින් දැනසිටිය යුතු අතර, අහඹු ලෙස අමතක විමක් සිදුවහොත් ලකුණු සටහන් කරු විසින් දැනගැනිමට හැකිවේ.

බෝලය

10. පන්දුව වර්ග දෙකකි. මෙහිදි ජ්‍යෙෂ්ඨ අය සඳහා පව්ච්චි කරනු ලබන පන්දුව අවුන්ස 05 ක් හා කණිෂ්ඨ අය සඳහා යොදාගනු ලබන පන්දුව අවුන්ස 4 ක් විය යුතුය. පන්දුව තොරා ගැනිම මුලින්ම පන්දු රකින කණ්ඩායමට හිමි වේ. නව පන්දුවක් ලබා ගැනිමට නම් පන්දුවාර 75 ක් හෝ පන්දුව පලුදු විමක් සිදු වුවහොත් නැවත අලුත් පන්දුවක් ලබාගැනිමට පන්දුව රකින කණ්ඩායමට අවස්ථාවක් ඇත. (විනිසුරුවන් දැනුවත් කිරිමෙන් පසු) පන්දුවේ වටප් ප්‍රමාණය විය යුත්තේ අගල් 9 කට අයත්ය. 09 ට වඩා අඩු වුවහෝත් කණිෂ්ඨ අය සඳහා යොදා ගැනේ. (රූප සටහන 1 බලන්න)

රූප සටහන 1

පිත්ත

11. පිත්තේ උස අගල් 38 ක. පලල උපරිම අගල් 4 1/4 කි. යම් හෙයකින් නුලකින් ඔතා තිබේනම් එහිදි පිත්තෙහි පළල දශමයක් පමණ වැඩිවිය හැකිය. (රූප සටහන 2 බලන්න)

රූප සටහන 2

12. ක්‍රිකට් පිත්ත සාදාගන්නා දැව වර්ග 03 පවතින අතර, එනම්:

අ. ඉංග්‍රිස් විලෝ

ආ. වයිට් විලෝ

ඇ. ක්ස්මිර් විලෝ

<u>තණ තිල්ල</u>

13. විකට්ටුවේ එක් අන්තයක මැද කුරේ මැද සිට අනෙක් අන්තය මැද කුරේ මැදට අඩි 20.12 යාරනම් 22 කි. තණ තිල්ලේ සම්පූර්ණ පළල මීටර් 3.05 ක් වන අතර, මෙම තණ තිල්ල සකස් කිරීම විනිසුරුට ක්‍රිඩකයින්ට අයිති රාජකාරියක් නොවේ. තරග පිටියේ භාරකරු විසින් මෙය නිවැරදි මිණුම් වලට සකස් කර දිය යුතුය. මෙහිදි තණ තිල්ලට අමතරව ග්‍රවුන්ඩ් මන් විසින් අමතර තණතිල්ලද සකස් කෙරේ. තරගයේ ආරම්භයේ සිට අවසානය වන තෙක් එහි භාරකාරාත්වය වනුයේ විනිසුරුවන් හට පමණි. (රූප සටහන 3 බලන්න)



රූප සටහන 3

<u>කඩුල්ල</u>

14. කඩුල්ලේ උස පොලෝවේ සිට බෙල්ස් නොමැතිව අගල් 28ක. ස්ටැන්ප් උඩ තැබිමෙන් එය අගල් භාගයකට වැඩිය උසවිය නොහැක.



රූප සටහන 4

තණතිල්ලේ ක්‍රිස් එක

15. මෙහිදි ක්‍රිස් කිපයක් ඇත. ඒ අතර පිතිකරුවන් රේඛාව බැටින් ක්‍රිස් එක මෙහි දිග ප්‍රමාණය අඩි 8ක් විය යුතුය. එය හතරේ සීමාව දක්වා විහිදි යන ලෙස සදහන් වේ. විකට්ටුවේ දෙපසින් පිටුසට විහිදෙන රේඛාව පොපොපි යනුවෙන් හැදින්වේ. විකට්ටුවේ සිට පිත්ත හසුරවන රේඛව අඩි 4ක් විය යුතුයි. රිටන් ක්‍රිස් එකද පිටුපසට අඩි 4 ක් විය යුතු අතර, එය හතරේ සීමාව දක්වා විහිදේ.

තිල්ල භූමිය සැකසීම

16. මෙහිදි තනතිල්ල සැකසීමෙන් පසු තරගය ආරම්භ කරන තෙක් වසා තැබේ. තරග ආරම්භ වු පසු මෙහි වගකිම විනිසුරුවන් සතුවේ.

ඉනිමක් යනු කුමක්ද

17. ප්‍රථමයෙන් පන්දුවට පහර දෙන කණ්ඩායම තිරණය කරනු ලබන්නේ කාසිය වාසිය උඩ දැම්මෙන්. එය සිදු නොකල යුතු අතර, ආරම්භක වේලාවකට වඩා විනාඩි 15 කට පෙර සිදුකල යුතු වේ. කාසිය වාසිය උඩ දැම්ම පිටිය තුල කල යුතු අතර, නිතියේ අවසර ඇත්තේ කාසිය වාසිය බැලිම ඔනැම කෙනෙකුට සිදුකල හැක. (තරග තිරිය/විනිසුරුවන් දෙනො) මෙය සාමාන්‍යයෙන් සිදුවන්නේ නායකයින් විසින් කාසිය උඩ දැම්මය. විශේෂයෙන් තරගය ආරම්භ කිරිමට නියමිත වේලාවට විනාඩි 30 කට ප්‍රථම කාසිය වාසිය උඩ දැම්ම නොකල යුතු අතර, ආරම්භක වේලාවට වඩා විනාඩි 15 කට පෙර සිදුකල යුතු වේ. ඉනිමක් අවසන් වනුයේ සියලු දෙනා දැවි යාමෙන් පසුවය. කාසිය වාසිය උඩ දැම්මෙන් පසු කාසියේ වාසිය දිනු කණ්ඩායමට තරග ආරම්භ කිරිමට විනාඩි 10 කට පෙර තම තිරණය දැනුම්දිය යුතුය.

පිට පිට දෙවරක් පහර දිම

18. මේ සිදුවනුයේ දින පහක තරගයකදි ලබාගත් ලකුණු වලට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය. දින පහක තරගයකදි දෙවන දිනයේදි ආරම්භ කිරිමකට නොහැකිව බාහිර බලපැමක් ඇති වුවහොත් එම තරගය දින 4කට සිමා කරයි.

විවේක කාලය

19. දින 02 සිට 05 දක්වා පවත්වනු ලබන අතර, තරග වලදි දිනක අවසානයේ සිට ඉලග දිනය උදේ දක්වා ලැබෙන විවේක කාලයන්. ඉනින් දෙකක් අතර ලැබෙන විවේක කාලය විනාඩි 10 කි. දිවා අහාරය සඳහා විවේක කාලය විනාඩි 30, 40 හා 60 ඒ තරග සංවිධාකයින්ගේ නිගමනය මත කාලය ඉවත් කෙරෙ. පිටිය තුලම ලබාදෙනු ලබන විනාඩි 05 විවේක කාලය වතුර පානිය කිරිම සඳහා පමණි. තේ පානය සඳහා ලබාදෙනු ලබන විවේක කාලය විනාඩි 20 කි. තවද ඔනැම තරගයකදි අන්තිම පැයේදි කිසිම හේතුවක් මත වතුර බිම සඳහා විවේකයක් විනිසිරු විසින් ලබාදෙනු නොලැබෙනු ඇත. විවේක කාලය වෙනස් කිරිමට හැකියාවක් ලැබෙනුයේ කාලගුණික තත්වයන් මත ප්‍රමාධ වි තරග ආරම්භ වුයේනම් නායකයින්ගේ කැමැත්ත මත විනිසුරුවන් සමග විවේක කාලය වෙනස් කල හැක. අන්තිම කඩුල්ල ඉතිරිව තිබුනහොත් තේ විවේකයට විනාඩි 05 ක් තිබියදි හෝ විවේකය ලබා නොදි එය ඉදිරියට තල්ලු කරනු ඇත. මෙය ජාත්‍යන්තර නිතියකි.

තරග ආරම්බය අවසානය

20. ප්‍රථමෙයෙන් විනුසුරුවන් දෙවනුව පන්දුව රකින්නන් හා පසුව පිති කරුවන් පැමිනේ. විනිසුරුවන් බෙල්ස් තබා පිටිය දෙස බලා ප්ලේ යනුවෙන් හඩ නගා කිමෙන් පසු තරගය ඇරඹේ. ඉනිම අවසන් කිරිමේදි නියමිත වේලාවට වඩා විනාඩි 03, 04 ක් තිබියදි තරගය නතර කල නොහැක. තරගය නතර කිරිමේදි වේලාව කිමෙන් පසු විනිසුරුවන් විසින් බෙල්ස් ඉවත් කරයි.

තරග ආරම්භ කරන පිටිය තුල පුහුණුවිම.

21. තරගයක් සඳහා පිටිය තේරිමේදි තණතිල්ල සකස් කෙරේ. මෙම තණතිලලට අමතරව තවත් තණතිලි එහි ඇත. මෙහිදි වෙන් කරන ලද තණතිල්ල හා එහි දෙපස ඇති අනෙක් තණතිලි දෙක පුහුණුවිම් සඳහා භාවිතා කල නොහැක. මෙයට අමතර පුහුණුවිම් සඳහා සකස් කරන ලද තණතිලි ක්‍රිඩාංගනවල ඇත. ඕනැම පුහුණුවක් තරග ආරම්භ කිරිමය විනාඩි 30 කට පෙර නතර කල යුතුය.

<u>දිවීමක් උපයන ලකුණු.</u>

22. දිවීම් ලකුණක් සම්පූර්ණ වනුයේ තමා පන්දුවට පහර දුන් රේඛාවේ සිට අනෙක් අන්තයේ පිති හැසිර වීමේ රේඛාව පසු කර ස්ථාන ගතවීමෙන් පසුවය. පිටියේ සීමාවට ඉහලින් පන්දුව පතිතවූ විට විනිසුරු විසින් ලකුණු 6 ලබා දෙන අතර, පිටියේ සීමාවට බිමේ ඇදී ගියහොත් විනිසුරු විසින් ලකුණු 04ක් ලබා දේ. ඈත පන්දුව මගින් ලකුණු ලබා ගැනිම. (WIDE BALL) නිපන්දුවක් මගින් ලකුණු ලබා ගැනිම. (NO BALL) වශයෙන් සලකනු ලබයි.

<u>ලකුණු සීමාවන් 4/6</u>

23. මෙය ලනු වලිවන්/බොඩ් වලින්/වෙලධ ලංජන වලින් සැකසිය හැක. තවද දර්ශණ පත යොදා ගනිමින් සීමාවට එලියෙන් තැබිය යුතු අතර, එය සුදු බෝලයක් සඳහා සුදු පාටින්ද සකසා ඇත. සැමවිටම ලණුවේ ඇතුල් සීමාව 4 හා ලණුවෙන් උඩට බෝලය වැටුන හොත් එය ලකුණු 6ක් හිමිවේ.

<u>පන්දුව පිටිය තුල අස්ථානගතවිට</u>

24. මෙහිදි පන්දුව පිටියෙන් ඉවත ගෙස් අස්ථානගත වුවහොත් (වහලයේ/ක්‍රිඩාගාරයෙන් පිටතට)ගොස් බෝල් යනුවෙන් කැගැසිය යුතුය. නැවත පන්දුවක් විනිසුරුවන් විසින් හා නායකයින් විසින් තෝරාගෙන නැවත ක්‍රිඩාව අරඹන්.

<u>ප්‍රථිඑල</u>

25. කණ්ඩායමක් ඉනිමකදි උපයන ලකුණු වලට වඩා අනෙක් කණ්ඩාම ඉපයිම. ඉනිම් දෙකක තරගයකදි නම් මෙය ඉනිම් හතරක් ක්‍රිඩා කර වැඩිපුර එක් කණ්ඩායම් ලකුණු ලබාගත යුතුය. එක් ඉනිමේ තරගයකදි නම් පලමු ඉනිමේ ලකුණු ප්‍රමාණය මත ජයග්‍රහනය හිමිවේ. සිමිත ඔවර් තරගයකදි නම් නියමිත පන්දුවාර 50 තුලදි ලබාගන්නා ලකුණු වලට වඩා දෙවන කණ්ඩායම ලකුණු ලබාගැනිම. එක් කණ්ඩායමක් පන්දුවට පහර නොදි පිටියෙන් ඉවතට ගියහොත් අනෙක් කණ්ඩායමට ජයග්‍රහනය ලබාදිමට විනිසුරු හට බලය ඇත.

<u>පන්දු යවන්නන්</u>

26. පන්දු යවනෙකු තමාගේ හා ලකුණ සටහන් කිරීමෙන් පසු දුවගෙන විත් පන්දු යවන ලද බෝල 6ක් ගණනය කිරීමෙන් ඔවර් එකක සැදේ. මෙම පන්දු 6 තුලදි පන්දු යවන්නා විසින් Wide ball /No ball යැවූ විට පන්දුවක් වැඩිපුර යැවිය යුතු වේ.

<u>පන්දුව අජීවී කිරීම</u>

27. මෙහිදි ඉබේම මෙය සිදුවන අතර යම් අවස්ථාවලදි අජීවී කරනු ඇත. නිරන්තරවන අජීවී වන පන්දු වනුයේ ලකුණු 6 ක් 4 ක් යාම. විනිසුරු තරගය නතර කිරීම. පිතිකරුගේ පෑඩ් එක තුලට බෝලය වැටිම. පන්දුව යවන්නා හට හෝ කඩුලු රකින්නා හට පන්දුව ලැබිමෙන්. පන්දු යැවීමට දුවයන එන අවස්ථාවේ බෙල්ස් වැටිමෙන් මෙහිදි විනිසුරු පන්දුව අජීවී කරනු ඇත.

<u>නිපන්දුව (NO BALL)</u>

28. යම් හෙයකින් පන්දු යවන අන්තය හා අත මාරු කරන විට එයද විනිසුරු දැනුවත් නොකර පන්දු යැවීම නිපන්දුවක් ලෙස සලකුණු ලැබේ. පන්දුව යැවීමෙන් පසු පිතිකරු ඉදිරියේදි පන්දුව දෙවරක් බිම වැදිමෙන් නිපන්දුවක් ලෙස විනිසිරු සංඥා කරයි. පන්දු යවන්නා විසින් පන්දුව ඉගට්යිට ඉහලින් පන්දුව යැවුව හොත් නිපන්දුවක් ලෙස සැලකේ. නිපන්දුවකින් ක්‍රිඩකයින් දැවී යන්නේ නැත.

<u>ඈත පන්දුව (WIDE BALL)</u>

29. පිතිකරු පන්දුවට පහර දිමට ස්ථානගතවූ ස්ථානයේ සිට පිත්ත යොමු කිරිමට නොහැකි දුරින් ඉදිරියෙන් පන්දුව යැවීම WIDE BALL වේ. පාදයේ පැත්තෙන් ශරිරයට වඩා ලංවේනම් මේ අනුව පුද්ගලයාගේ අතේ දිග හා ශාරිරයේ උස අනුව මෙය වෙනස් වේ. කඩුල්ල පසුවන තුරු ඇත. පන්දුව තිරණය කල නොහැක. WIDE BALL පන්දු වාරයකට ගණන් නොගැනේ.

<u>අමරත උපයන ලකුණු</u>

30. පිතිකරු පිත්ත ඔසවා සිටියදී කඩුලු රකින්නා හට බෝලය අල්ලා ගැනිමට නොහැකිව සීමාවට යන ලකුණු ගණනය කෙරේ.

<u>ඉල්ලීම්</u>

31. සෑම විටම විනිසුරුට දැවියාමක් දිය හැක්කේ පන්දුව රකින පිලෙන් ඉල්ලීමක් කල හොත් පමණි. විනිසුරු දැවියාමේ සංඥාවේ නොමැතිව කිසිවිටකවත් දැවිගියා සේ සලකා පිටියෙන් ඉවත් විය නොහැක. ඉල්ලීම් ක්‍රම දෙකකි. එනම්:

අ. පිතිකරුවෙකු දවා ගැනිමට කරන ඉල්ලීම.

ආ. යම් විටක පිතිකරුවන් විසින් ක්‍රීඩා කිරීමට අපහසු නිසා හෝ පිටිය හොඳ මදි නිසා හෝ නවාතා ඇති තරග ආරම්භ කරන ලෙස නායකයින් දෙදෙනා විසින් එකගව කරන ඉල්ලීම්.

<u>කඩුල්ල කැඩියාම</u>

32. කඩුල්ල කැඩි ගිය බවට තිරණය වනුයේ කඩුල්ල මත තබා ඇති බේල්ස් එකක් හෝ ඉවත් විමෙන් පසුවය. පන්දුව කෙලින්ම කඩුල්ලේ වැදි යාම. පහර දෙන විටදි පිත්ත හෝ ඇදුමේ කොටසක් කඩුල්ලේ වැදිම. පන්දු රකින්නේකු පන්දුව විකෙට්ටුවට ගැසු විට. විකට්ටුව සිටවිය යුතුය මුලිකවම හිටවා තිබු තැනමය.

<u>පිතිකරු සීමාව තුල නොසිටිම</u>

33. පිතිකරුගේ සීමාව යනු පිතිකරු රේඛාවේ ඇතුල් ඉඩ සිට පිටුපසට වන අතර. එම රේඛාවේ අයිති වනුයේ පන්දු රකින්නන්ට වේ. ශරීරයේ කොටසක් හෝ පිතිකරුගේ සීමාව තුල නොසිටිම.

<u>පන්දුව කඩුලේ වැදි යාම</u>

34. දැවි යාම සඳහා පිවි පන්දුවක් විය යුතුය. පන්දුව පිතිකරුගේ ශරීරයේ වැදි කඩුලේ වැදිම. පහර දුන් පන්දුව ආපසු හෝ කඩුල්ල එම නිසා නැවත පහර දිමේදි පිත්ත කඩුල්ලේ වැදිම.

<u>කාල බාධක</u>

35. යම් පුද්ගලයෙකු දැවි ගොස් විනාඩි 03 ක් ඇතුලත ඉලග පිතිකරු පිටියට නොපැමිනියේ නම් විනිසුරු විසින් ඔහු දැවිගිය ක්‍රිඩකයෙකු ලෙස නම් කරනු ලබයි. කාල බාධකයට හසුවු ක්‍රිඩකයා දැවියාම් පොතේ සටහන් කරනුයේ TIME OUT යනුවෙන්ය.

<u>උඩ පන්දුව</u>

36. නිත්‍යානුකුල පන්දුවක් පිත්තෙන් හෝ පිත්ත අල්ලා සිටින අත් ආවරණයේ වැදි ගිය විට නැවත බිම පතිත විමට පෙර සීමාව තුල රැදි සිටිමින් පන්දුව අල්ලා ගෙන ඔනෑම අයුරකින් මුදා හැරීමට හැකි ආකාරයට අල්ලා ගෙන පිටිය තුල රැදි සිටිම වේ. පිතිකරුගේ පිත්තේ වැදි බුට් ඒකේ වැදි එන පන්දුව උඩ පන්දුවක් ලෙස ගණන් ගැනේ.

<u>පිවිවි පවතින පන්දුව අල්ලිම</u>

37. පන්දු රකින්නන්ගේ අවසරයක් නොමැතිව පිතිකරුට පිවිවි පවතින පන්දුව අතින් ඇල්ලිය නොහැක. කඩුල්ලේ අයිතිවාසිකම් පන්දු යවන්නාට හිමි වේ.

<u>පිවිව පන්දුවකට දෙවරක් පහර දිම.</u>

38. මෙය පිත්තෙන් පමණක් නොවේ පලමු ශරීරයේ හෝ වෙන ස්ථානයක වැදි නැවත පිත්තෙන් ගැසිම මෙලෙස හැදින්වේ. පිත්තෙන් දෙවරක් පහර දිම.

<u>තමා විසින් කඩුල්ල කඩා ගැනීම</u>

39. තමා පන්දුවට පහර දෙන අවස්ථාවේදිම තමාගේ පිත්තෙන් ඇදුමෙන් ශරීරයෙන් කඩුල්ල කැඩී යාම මේසේ සඳහන් වේ.

<u>කඩුල්ල මුවා කිරීමේ වරද</u>

40. මෙහිදී විනිසුරුගේ පූර්ණ නිගමනය වනුයේ පන්දුව පාදයේ නොවැදුනානම් කඩුල්ලේ වදින බවය. සැම විටම විනිසුරු විසින් කඩුලු දෙක අතර අගල් 9ක මනක් කල්පිත රේඛාවක් ඇඳගෙන ඇත. මෙහිදී පා පෙදෙස රේඛාවට පිටින් පතිත පන්දුවට සම්පූර්ණ කඩුල් ආවරණය කර තිබුනද දැවී යාම සිදු නොවේ.

<u>පන්දු රකින්නන්ට බාධා කිරීම</u>

41. මේ හිතා මතා කල යුතු වේ. දෙදෙනාම නොදැනුවත්ව ගැටීම මෙය නොවනු ඇත. පන්දු රකින්නන්ට බාධාකල හැක්කේ පිතිකරුට පමණි. බාධාකිරීමේදි සැම විටම දැවී යනු ලබන්නනේ පන්දුවට පහර දුන් පුද්ගලයා වේ. පිතිකරුට බාධා කිරීමේදි විනිසුරු DEAL BALL යනුවෙන් කියා කෑ ගැසිය යුතුය.

<u>දුවද්දි දැවී යාම</u>

42. පිතිකරුවන් දෙදෙනාගෙන් ඕනෑම අයෙකු දැවී යා හැක.කඩුල්ල බිඳ දමන අවස්ථාවේ එම කඩුල්ලට ඉතා අසාන්නයෙන් ඇති පුද්ගලයා දැවී යනු ඇත. කඩුල්ල කඩන විට ඒ අසලට පැමිණි පුද්ගලයා දැවියනු ඇත.

<u>ස්ටම්ප් කිරීම</u>

43. ස්ටම්ප් කිරීමක් කල හැක්කේ කඩුලු රකින්නාට පමණි. අනෙකුත් පන්දු රකින්නාගේ උපකාරයකින් තොරව ඔහු විසින්ම කඩුල්ල කඩා දැමිය යුතුය.

<u>කඩුලු රකින්නා</u>

44. පිතිකරුට අමතරව පන්දු රකින කණ්ඩායමේ නිතියෙන් පිටත ආවර්ණය පැලදිමට අවසර ඇත්තේ මොහුට පමණි. පෑඩ් නොමැතිව විකට් රැකිමට එරෙහිව අනෙකුත් විරුද්ධ විය හැක. නමුත් නිතියෙන් පෑඩ් පැලදිම අනිවාර්ය වේ.

<u>ක්‍රිඩකයා</u>

45. සැමවිටම කණ්ඩායමේ ක්‍රිඩකයින් 11 දෙනාගෙන් කෙනෙකු කඩුලු රකින්නා හා කෙනෙකු පන්දු යවන්නා වේ. පන්දු රකින්නනාට පිතිකරු අසල සිට දැගලිය නොහැක.

<u>සාධාරන අසාධාරන</u>

46. පන්දුවේ ස්වභාවය වෙනස් කිරිම. හිතාමාතා පහරදෙන පිතිකරුට බදා කිරිම. හිතාමතා පහරදෙන අයට දුවන විට බාධා කිරිම. අන්ත්‍රකාරි ලෙස පන්දු ගැවීම.

<u>නිල්ල ආවර්ණය</u>

47. මෙහිදි නිල්ල සැකසිමෙන් පසු තරගය ආරම්භ කරන තෙක් වසා තැබේ. ආරම්භ වු පසු Ground Anthoraty (ග්‍රවුන්ඩ් ඇන්තරටි) වගකිම නොගන්නා අතර එහි වගකිම විනිසුරුවන් සතු වේ. නිල්ල වැසිම සඳහා නීතිමය වන්නේ පිති හසුරුවන රේඛාවේ සිට දෙපසින් 5 සිට ඇතුලත ප්‍රදේශය වන අතර නමුත් සම්පුර්ණ නිල්ල ආවරණය සම්පූර්ණම සිදුකෙරේ. පන්දු යවන්නාගේ දුවන මාර්ගය වැසිය හැක. මේ සැම දෙයක්ම කණ්ඩායමේ නායකයින් දැනගත යුතුවේ. මෙම ආවරණ බවත් කිරිම කල යුත්තේ හැකි කරම් කල්වේලා ඇතිවය.

<u>කෙළවර කිරීම (පාවා දීම)</u>

48. මෙහිදි කෙලවර කිරීම කල හැක්කේ නායකයා විසිනි. මෙම අවස්ථාවේදි ඕනැම් අයුරකින් මෙය සිදුකල හැක. මෙහිදි එක් පන්දුවක් හෝ ක්‍රිඩා කිරීම Declare වන අතරණී එක් පන්දුවක් හෝ ක්‍රිඩා නොකලේ නම් එය For feat වේ. Declare කිරීම අනිවාර්‍යයෙන්ම පැය දෙකක් වත් ක්‍රිඩා කිරීමෙන් පසු සිදුකල යුතු බවට Tournament Rule (ටුනමන්ට් රූල්)එකේ සකස් කර ඇත.